රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021

මගේ අංකය: EST-6/03/LEA/3381
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.03.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්

## රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම

ඉහත මැයෙන් මගේ අංක EST-1/MISCL/06/0032 හා 2020.10.28 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2020 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම වෙනුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා සමගාමීව අනෙකුත් රාජ්‍ය සේවා ද බාධාවකින් තොරව පවත්වාගෙන යාම වෙනුවෙන් 2021.03.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය අංශයේ සියලුම නිලධරයන් සාමාන්‍ය පරිදි සේවයට කැඳවීමට කටයුතු කළ යුතු ය.

03. එමෙන්ම කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජයේ ආයතන ප්‍රධානීන් විසින් අනුගමනය කළ යුතු උපදෙස් ඇතුළත් කරමින් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති 2020.04.18 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/20/2020 චක්‍රලේඛය, 2020.05.14 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/21/2020 චක්‍රලේඛය සහ 2020.10.29 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/33/2020 චක්‍රලේඛය යන චක්‍රලේඛයන්හි සඳහන් කාර්ය මණ්ඩලය සේවයට කැඳවීම සීමා කිරීම පිළිබඳ උපදෙස් හැර රජයේ නිලධරයන්ගේ හා මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු අනෙකුත් සෞඛ්‍ය උපදෙස් තවදුරටත් එලෙසම අනුගමනය කළ යුතු ය.

04. ඉහත 03හි සඳහන් චක්‍රලේඛ අනුව නිසි සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් ආයතනික කාර්ය මණ්ඩලය මෙන් ම සේවාලාභීන් ද කොවිඩ් 19 වෛරසය ආසාදනය වීමෙන් වළක්වා ගනිමින් සේවා සැපයීමේ වගකීම ආයතන ප්‍රධානීන් වෙත පැවරෙන බව ද අවධාරණය කෙරේ.

05. 2021.03.08 දින සිට නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය.

06. 2020.03.13 දින සේවයෙන් පසු සෞඛ්‍ය උපදෙස් අනුව තාවකාලිකව සේවා සැපයීම් නතර කළ රජයේ ආයතන නැවත යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් 2021.03.08 දින දක්වා වරින් වර නිකුත් කළ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරමින් රජයේ නිලධරයන් සේවයට කැඳ වූ කාල සීමාව තුළ ඔවුන් ලබාගත් නිවාඩු ඔවුන්ගේ සේවය ස්ථිර කිරීම්, උසස්වීම් ලබා දීම් හා විශ්‍රාම ගැන්වීම් ආදී කටයුතු සඳහා අදාළ කර ගැනීම පිළිබඳව අවශ්‍ය උපදෙස් ඉදිරියේ දී නිකුත් කෙරේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය